# දැන්වීමයි

## තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

### පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව උතුරු පළාත

### උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්මේන්තුව කොමසාරිස් තනතුර සඳහා පුරප්පාඩු පිරවීම - 2017

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්මේන්තුව කොමසාරිස් තනතුර පුරප්පාඩුවට තනට ශ්‍රී ලංකා දේශීය ආදායම සේවයේ ඇති සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2017.05.31 වේ.

02. සුදුසුකම්:-

i. ශ්‍රී ලංකා දේශීය ආදායම සේවයේ I ශ්‍රේණියේ ඇති නිලධාරියෙකු වීම.

* (ශ්‍රී ලංකා දේශීය ආදායම සේවයේ II වන ශ්‍රේණියේ ඇති නිලධාරියෙකු ද ඉල්ලුම් කළ හැකිය. ශ්‍රී ලංකා දේශීය ආදායම සේවයේ I වන ශ්‍රේණියේ ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කිසිවක් නොලැබු අවස්නාවේදි පමණක් II වන ශ්‍රේණියේ ඇති නිලධාරීන්ගේ අයදුම්පත්, අදාළ තනතුරේ රාජකාරි ක්‍රියාත්මක පතනම් මද්ද භාරකණු ලැබේ.)

ii. අයදුම්කරුවන් අදාල ශ්‍රේණියේ 2017.05.31 දිනට පූර්වාසන්න අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, එම කාලය තුළ ලැබිය යුතු සියළුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම සහ කිසිදු විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැතිවීම.

iii. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 60 ට අඩුවිය යුතුය.

03. බඳවා ගැනීීමේ ක්‍රමය:-

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා දේශීය ආදායම සේවයේ ඇති අයදුම්කරුවන් අතුරින් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවා මෙම තනතුර සඳහා පත්කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් කේෂ්ත්‍රයන් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.
(මුළු ලකුණු 100 යි)

i. වර්තමාන ශ්‍රේණිය - ශ්‍රී ලංකා දේශීය ආදායම සේවයේ I ශ්‍රේණිය/IIශ්‍රේණිය
(රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ලබාදි ඇති අදාල තනතුරු උසස්වීම සඳහා වන පත්කිරීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය)

ii. අධ්‍යාපන සුදුසුකම් - Post Graduate Degree/ Diploma

iii. දැරූ තනතුරු - කොමසාරිස්/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් /නියෝජ්‍ය කොමසාරිස්

iv. භාෂා නිපුණතාවය

v. විශේෂ ජයග්‍රහණ

vi. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය

04. ඉල්ලුම් කළයුතුතු ආකාරය:-

මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම පමණක් ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රය 2017.05.31 දිනට හෝ ඊට ප්‍රථම "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංකය 393/48, කෝවිල පාර, යාපනය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පර්ූණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම

ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

05. මෙම තනතුර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ තීරණය අවසාන තීරණය වන අතර, මෙම පත්කිරීම් සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණු පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ.

**රූ.වරදලිංගම්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
04.05.2017

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්මේන්තුව කොමසාරිස් තනතුර සඳහා පුරප්පාඩු පිරවීම - 2017

01. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ……………………………………………………………

02. ලිපිනය (ඉංග්‍රීසිකැපිටල්අකුරෙන්)ඃ-

i. කාර්යාලීය ලිපිනය : ……………………………………………………………………...

.......................................................................................................................................

ii. පෞද්ගලික ලිපිනය: ………………………………………………………………………

.......................................................................................................................................

03. උපන් දිනය: වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

04. 2017.05.31 වන දිනට වයස ඃ- අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

05. ජාතික හැඳුනුම්පත් අංකය: [ | | | | | | | | | | | ]

06. දුරකතනඅංක. / විද්‍යුත් තැපැල් ලිපිනය:

i. කාර්යාලයීය : ……………………………………………………………........................

ii. පෞද්ගලික: ……………………………………………………………..........................

iii. ෆැක්ස් (Fax) : ……………………………………………………………........................

iv. විද්‍යුත් තැපැල් ලිපිනය: …………………………………………………….......................

07. සේවා විස්තරය (මුල් පත්වීමේ සිට)

| සේවා ස්ථානය | තනතුර | කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

08. දැනට දරන තනතුර හා ශ්‍රේණිය : ………………………………………………………………

09. දැනට දරන තනතුරෙහි පත්වීම් ලැබූ දිනය: ………………………………………………

10. දැනට දරන සේවය විස්තර :

| සේවා ස්ථානය | තනතුර | කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

11. අධ්‍යාපන සුදුසුකම්: ………………………………………………………...........

12. භාෂා හැකියාව (මව්භාෂාව හැර) : ………………………………………………………..................

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය :…………………… ……..…………………………

අයදුම්කරුගේ අත්සන

13. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:-

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියෙකු වශයෙන් සේවය කරන....................................................................... මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කරඉදිරිපත් කරමි. මොහු මෙම තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට සිටින සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, මොහුගේ වර්ශ .......................... සේවයේ සම්බන්ධයෙන් විනයානුකුල ගැටළු කිසිවක් නොමැතිබවත්, මොහු විසින් සපයා ඇති තොරතුරු ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

.........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය: .........................................................
නම: .........................................................
තනතුර : .........................................................
ලිපිනය: .........................................................
(නිල මුද්‍රාවෙන්සනාථ කරන්න.)